# පහත රට වැසි වනාන්තරබද ග්‍රාමීය ප්‍රදේශවල සාම්ප්‍රදායික දඩයම ආශ්‍රිත අභිචාර විධි (සිංහරාජ වනාන්තරයේ වයඹ දිග බෑවුම ඇසුරිනි)

ආර්.කේ. චමින්ද කුමාර, ආර්.එම්. අනුරාධා සඳමාලි

## සාරාංශය

මානව ශිෂ්ටාචාරයෙහි දඩයමට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. මිනිසා දඩයමට හුරු පුරුදු වූයේ අදට වසර දහස් ගණනකට පෙර ය. එඬේර යුගයට හා ගොවි යුගයට පෙර මිනිසා ජීවත් වූයේ දඩයම් යුගයේ ය. ඒ කාලය තුළ ඔහුගේ ප්‍රධාන ජීවනෝපාය වූයේ දඩයමයි. එතැන් පටන් අද දක්වා ම දඩයම මානව ජන ජීවිතය හා සම්බන්ධව පවතී. අනාදිමත් කාලයක සිට ශ්‍රී ලාංකිකයා ද දඩයමට ප්‍රමුඛස්ථානයක් ලබා දී ඇත. ඒ ඔහුගේ සෑම ප්‍රධාන ආහාර වේලක ම මූලික ස්ථානයක් "දඩ මසට" ලබා දී තිබූ බැවිනි. එම නිසා දඩයම් හා බැඳුණු සුවිශේෂී අභිචාර විධි ගණනාවක් ශ්‍රී ලංකාවෙහි ප්‍රාදේශීය වශයෙන් හඳුනා ගත හැකි ය. ඒවා සියල්ල ම මිනිසාගේ ඇදහිලි හා විශ්වාස මත පදනම් ව ඇත. ඒ අනුව මෙම අධ්‍යයනයෙන් පහත රට වැසි වනාන්තර ආශ්‍රිත ග්‍රාමීය ප්‍රදේශයන් හි සාම්ප්‍රදායික දඩයම් ආශ්‍රිත අභිචාර විධි මොනවාද යන්න සාකච්ඡා කිරීමට අපේක්ෂිත ය. මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ වූයේ පහත රට වැසි වනාන්තර ආශ්‍රිත ග්‍රාමීය ප්‍රදේශවල සාම්ප්‍රදායික දඩයම් ආශ්‍රිත අභිචාර විධි මොනවාද යන්න හඳුනා ගැනීම යි. ඊට අමතර ව දඩයම් කරනු ලබන සත්ත්ව විශේෂ හඳුනා ගැනීම, එම සතුන් මස් පිණිස සකස් කර ගැනීමට අනුගමනය කරනු ලබන ක්‍රමවේද හඳුනා ගැනීම සහ වර්තමානයෙහි දඩයම් ආශ්‍රිත ප්‍රවණතා හා ගැටලු හඳුනා ගැනීම සෙසු අරමුණු අතර වෙයි. සිංහරාජ රක්ෂිත වනාන්තරයෙහි වයඹ දිග බෑවුමෙහි පිහිටා ඇති කුඩාව, සෙනියකන්ද, පිටකැලේ, බුත්කන්ද, කෙටිලපත්තල, කොස්ගුලාන සහ කොන්ගහකන්ද යන ගම්මාන කේන්ද්‍රකර ගනිමින් සිදු කරන ලද මෙම අධ්‍යයනය සඳහා ප්‍රශ්නාවලි සමීක්ෂණය, සම්මුඛ සාකච්ඡා සහ සහභාගීත්ව නිරීක්ෂණ දත්ත රැස් කිරීම සඳහා භාවිත කරන ලදී. එම දත්ත සරල ප්‍රතිශතාත්මක ක්‍රම සහ ගුණාත්මක ක්‍රම ඇසුරින් විශ්ලේෂණය කරනු ලැබිය. ඒ අනුව මෙම අධ්‍යයනයෙන් ප්‍රදේශයෙහි වාසය කරන සත්ත්ව විශේෂ 64 ක් පමණ දඩයම් කරන බව හඳුනා ගත හැකි විය. ඉන් විශේෂ 23 ක් (35.94%)